# 3. අසල්වැසියන්ගේ ආදරය

නයනා : කවුද අම්මේ අපේ අසල්වැසියෝ කියන්නේ?

අම්මා : අසල්වැසියෝ කියන්නේ දුව, අපි යන එන ඕනෑ ම තැනක දී අපට හමුවන අය. ඇයි දුව දන්නේ නැද්ද? බයිබලයෙත් තියෙන්නේ ඔබේ අසල්වැසියාට ආදරය කරන්න කියලා.

නයනා : කොහොමද අම්මේ අපි පාරේ යන කොට අපිට අසල්වැසියෝ ඉන්නේ?

අම්මා : දුව, අපි හඳුනන අය විතරක් නෙවෙයි, අපි හඳුනන්නේ නැති අය වුණත් අපේ අසල්වැසියෝ වෙනවා. ඔවුන්ගෙන් අපට ආදරය ලැබෙනවා. උපකාර ලැබෙනවා.

නයනා : ඒ කොහොමද අම්මේ?

අම්මා : මම දවසක් පොළට ගිහිං බඩු අරගෙන, බස් එකට නගින්න යනකොට මගේ බෑගය කඩාගෙන වැටුණා. මම ගත්ත බඩු පාරේ හැම තැන ම. මම ඒවා එකතු කරන කොට පුංචි පුතෙක් ඇවිත් බඩු ටික ඇහිඳගන්න මට උදවු කළා. ඒ පුංචි පුතා, ළඟ තිබුණු කඩෙන් තවත් බෑගයකුත් ගෙනත් දුන්නා.

ඉතිං මම ඒ පුංචි පුතාට ස්තුති කළා, මට උදවු කළාට. ඒ පුතා කළා වගේ අපිත් ඕනෑම වේලාවක අපේ ළඟ සිටින උදවු උවමනා ඕනෑම කෙනෙකුට උපකාර කරන්න ඕනෑ. දැන් දුවට තේරුණා ද කවුද අසල්වැසියන් කියන්නේ කියලා.

නයනා : ඔව් අම්මා මට දැන් තේරුණා.
මමත් ඒ මල්ලී වගේ අන් අයට උදවු කරනවා.

අම්මා : මගේ හොඳ දුව, දේව පියාත් ඒ ගැන සතුටු වේවි.

## පැවරුම්

1. මෙම කතාවේ එන අවස්ථාව චිත්‍රයට නගන්න.

2. අසල්වැසියන්ට කළ හැකි උපකාර කිහිපයක් ලියන්න.